# බුද්ධ ධර්මය

## 1 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 29 පාඩම
# රුවන්මැලිසෑය වඳිමු.



මේ පාඩම්වලින් ඔබේ දරුවාට ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිද්ධස්ථාන පිළිබඳ අවබෝධයක් ලැබේ.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෘ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**දෙමව්පියනි/වැඩිහිටියනි,**

බුද්ධ ධර්මය 1 ශ්‍රේණිය පෙළ පොත භාවිත කරමින් දරුවා මෙම ක්‍රියාකාරකම් වල නිරත කරවන්න. දුෂ්කරතා දැක්වුවහොත් දරුවාට උදව් කරන්න.

## පියවර 1

❖ පාඩම හොඳින් කියවමු .

❖ මේ කවිය තාලයට ගායනා කරමු. (ශ්‍රද්ධාවෙන් යුතුව )

රුවන්මැලිය සිත සනසනවා
ගැමුණු රජුන් මට සිහිවෙනවා
දොහොත් මුදුන් දී නමදිනවා
බුදු ගුණ ලොවට ම සෙත දෙනවා

හොඳට ගායනා කළා  ✓

## පියවර 2

❖ රුවන්මැලිසෑයට එම නම ලැබුණ විදිය දන්නවාද ?

❖ මෙහි දී දෙමවුපියන් /වැඩිහිටියන් එම නම හැදුන ආකාරය කියා දෙන්න .



Copyright © www.e-thaksalawa.moe.gov.lk

පියවර 3

❖ අපි චෛත්‍යයක් නිර්මාණය කරමු.

- මේ සමග ලබා දී ඇති චෛත්‍යයක රූපය, කළු කඩදාසියක අලවා දරුවාට ලබා දෙන්න.
- සුදු පාට කඩදාසි ගුලිකර චෛත්‍ය මත ඇලවීමට දරුවා යොමු කරන්න.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

හොඳයි. රුවන්මැලිසෑය නිර්මාණය කළා. ✓

පියවර 4

- ❖ අපි දැන් රුවන්මැලි මහා සෑය වන්දනා කරමු.

කිරි පාටින් බැබලෙන්නේ
සම්බුදු ගුණ පැතිරෙන්නේ
රන්මැලි සෑ සමිඳුන්නේ
සාදු සාදු නමදින්නේ

හොඳයි .රුවන්මැලි මහා සෑය වන්දනා කළා . ✓


Copyright © www.e-thaksalawa.moe.gov.lk